# 21වන ශතවර්ෂයේ දී විද්‍යාත්මක පර්යේෂණ තුළින් සනාතවන බුද්ධ දේශනාවෙහි වලංගුතාව (අංගුත්තර නිකායේ දන්තකට්ඨ සූත්‍රය ඇසුරින්)

කැටවල සමිත හිමි[1]

## හැඳින්වීම

බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරනු ලැබූ අසූහාරදහසක් ධර්මස්කන්ධය තුළ පවතින ජීව විද්‍යාත්මක හා භෞතික විද්‍යාත්මක විෂයන් හි ලා සැලකිය හැකි ය. ඇතැම් කරුණු නූතන විද්‍යාත්මක රාමුවක් තුළ සනාථ වෙමින් පවතී. එබඳු අවස්ථා ගණනාවක් ම ඉතා ප්‍රසිද්ධව ඇතත් මෙතෙක් කිසිවෙකු විසින් තුලනාත්මකව පෙන්වා නොදුන් කරුණක් සම්බන්ධයෙන් මෙම විමර්ශනය කිරීම සිදුවේ.

## පර්යේෂණ ක්‍රමවේදය

සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනය කිරීම මගින් තොරතුරුව ඒකරාශීකිරීම මෙම පර්යේෂණයේ මූලික ක්‍රමවේදය වෙයි. ග්‍රන්ථ සන්ධාර ක්‍රමයට සඅනුගත ව මෙම පර්යේෂණය ප්‍රාථමික මූලාශ්‍රය පරිශීලනය, ද්විතීක මූලාශ්‍රය පරිශීලනය, සඟරා සහ කෝෂ ග්‍රන්ථ පරිශීලනය හා අන්තර්ජාල පරිශීලනය යන ක්‍රමවේදයන් ඔස්සේ සිදුකොට ඇත. දත්ත විශ්ලේෂණයේ දී  නිගාමී තර්කනයෙන් නිගමනය වෙත යොමුවනු ලැබේ.

## සාකච්ඡාව

යහපත් මුඛ සෞඛ්‍යයක් පවත්වාගනු ලබන සෑම පුද්ගලයෙකු ම උදෑසන හා රාත්‍රී ද ආහාර ගැනීමෙන් අනතුරුව ද පසුව ද ස්නානය පෙර ද දත් මදී නු ලබයි. එසේ ම දත් මැදී ම මගින් සිදු වන ආනිසංස පහක් දන්තකට්ඨ සූත්‍රයේ දැක ගත හැකි ය. ඉන් පළමු වැන්න වනුයේ ඇසට හිතකර බව යි. මෙහි සඳහන් ආකාරයට දත් මැදී ම ඇස්පෙනීමට බලපාන්නේ ද යන ගැටලුව ඇති වූ බැවින් මෙම විමර්ශනය සඳහා පෙළඹවීමක් ඇති කළේ ය. ඒ අනුව මෙම විමර්ශනය දත් මැදී මෙන් ඇසට ඇති වන ප්‍රතිඵලය හා දත් හා ඇස අතර පවතින සම්බන්ධය නූතන විද්‍යාත්මක රාමුවක් තුළ සාකච්ඡා කිරීමත් ත්‍රිපිටකය හා තදනුබද්ධ අට්ඨකතා තුළ මේ සම්බන්ධව දරණ මතය කෙබඳුදැයි තුලනාත්මකව සාකච්ඡා කිරීම මෙම විමර්ශනයෙහි අරමුණයි.

දෛනිකව බුද්ධකාලීන සමාජය තුළ ද සිදුවූ ක්‍රියාවක් ලෙස දත්මැදී ම පෙන්වාදිය හැකි ය. ඒ සඳහා මූලාශ්‍රය වනුයේ අංගුත්තරනිකායේ පඤ්චකනිපාතයේ පඤ්චමපණ්ණාසකයේ කිම්බිල වග්ගයේ අටවන දන්තකට්ඨ සූත්‍රය (5:5:1:8) හා විනයපිටකයේ චුල්ලවග්ගපාලියේ සමථක්ඛන්ධකයේ ඛුද්දකවත්ථුක්ඛන්ධකය වේ. මෙහි

1. ව්‍යවහාරික බෞද්ධ අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය.
venketawalasamitha@gmail.com

දී බුදුරජාණන් වහන්සේ විසින් දැහැටි නොවැළඳී ම (දත් නොමැදී ම) හේතුවෙන් ඇතිවන ආදී නව පහක් පිළිබඳ ව දේශනා කරනු ලබයි. (පඤ්චිමෙ භික්ඛවෙ ආදී නවා දන්තකට්ඨස්ස අඛාදනෙ.) (අං.නි-5:5:1:8) මෙහි පළමුවැන්න වනුයේ ඇසට අහිතකරය (අචක්ඛුස්සං) යනුවෙනි. එහි පද විග්‍රහය වනුයේ න+චක්ඛු+ස්ස යන්නයි. ඉංග්‍රීසි භාෂාවෙන් 'na cakkhussa' යනු bad දෙර the eyes ලෙස දක්වා ඇත. ඒ පිළිබඳ ව අටුවාවෙහි දක්වනුයේ "අචක්ඛුස්සන්ති න චක්ඛුනං හිතං, චක්ඛුං විසුද්ධං න කරොති". එහි අචක්ඛුස්සං යනු ඇසට හිත නොවූ, ඇස පිරිසිදු නොකරයි යන්නයි. මේ අනුව දත් හා ඇස අතර පවතින සම්බන්ධයක් පිළබඳ ව අදහසක් බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. එය කෙබඳු දැයි විමර්ශනය කිරීම බටහිර වෛද්‍ය විද්‍යාව ඔස්සේ ද විමසා බැලිය යුතු ය.

දන්තකට්ඨ සූත්‍රයේ දී මෙය තවත් තහවුරු කරනු ලබන්නේ බුදුරජාණන් වහන්සේ දැහැටි වැළඳීමේ ආනිසංසයන් ද ගෙනහැර දැක්වීමෙනි. එනම්, මහණෙනි, දැහැටි වැළඳීමේ අනුසස් පහකි. (පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා දන්තකට්ඨ ඛාදනෙ) ඇසට හිත වෙයි (චක්ඛුස්සං) යනුවෙන් දැක්වීමයි. (පාලි සිංහල අකාරාදිය, පිට 190) එය ඉංග්‍රීසි බසින් අර්ථ ගැන්වෙන්නේ good for the eyes ලෙස ය. (PTS)

දැහැටි වැළඳීම/දත් මැදී ම

දැහැටි වැළඳීම හා දත් මැදී ම සමාන කාර්යයන් ලෙස දෘශ්‍යමාන වුව ද මෙහි පරස්පරතා කිහිපයක් දැකගත හැකි ය. මෙහි පවතින සමානතා වනුයේ දත්, දිව හා මුඛය යම් ආධාරකයක් භාවිතයෙන් පිරිසිදු කර ගැනීමයි. නමුත් එහි සිදුවන කෘත්‍ය එකිනෙකට වෙනස් වේ.

දත් මැදී ම

දත් මැදී ම යනු කෙඳි සහිත බුරුසුවක් ගෙන දත් මැදී ම සඳහා භාවිතවන කුඩක් හෝ ආලේපයක් බුරුසුව මතට ගෙන බුරුසුව ආධාරයෙන් මුඛය පිරිසිදු කිරීමයි.

දැහැටි වැළඳීම

දැහැටි වැළඳී ම යනු අතීතයේ මුඛ පවිත්‍රකරණයට යොදාගත් ක්‍රමවේදයයි. එනම්, ඖෂධීය ගසකින් (කරඹ, පිල, මූණමල්, කරඳ, බෝමු) කපාගනු ලබන ශාක කොටසක් ගෙන කෙළවර දත්වලින් සැපීම මගින් බුරුසුවක් ලෙස සකස් කොට ගෙන දත් මැදී මයි. මෙම අතුකැබැල්ල දැහැටි දණ්ඩ, දැහැටිකූර යන නම් වලින් හඳුන්වනු ලබයි. මෙය ආයුර්වේදය තුළ ද අනුමත කරන ලද ක්‍රියාවකි.

**ඇස් හා දත් අතර අන්තර් සබඳතාව පිළිබඳ වෛද්‍ය විද්‍යාත්මක තොරතුරු**

වෛද්‍ය විද්‍යාව මෑත භාගයේ දී සිදු කරන ලද පර්යේෂණ මඟින් ඇස් පෙනීම හා මුඛ සෞඛ්‍යය පවත්වාගැනීම පිළිබඳ ව අන්තර් සබඳතාවක් ඇති බව පෙන්වා දෙයි. එම පර්යේෂණ මඟින් පෙන්වාදෙනු ලබන්නේ විදුරුමස් දියවීමේ රෝගය (Periodontal disease) හේතුවෙන් ඇති වන ආසාදන හා ඉදිමීම් ඇස් පෙනීමට සම්බන්ධ ස්නායුවලට හානිකරන බව සොයාගෙන ඇත. එමඟින් ඇසේ පෙනීම දුර්වල වන බව වෛද්‍ය

කුමාර ටී. වඩිවේල් මහතා පවසයි. එසේ ම දත් දිරායාම හා විදුරුමස් රෝග හේතුවෙන් ඇස්වල ආබාධ ඇති වීමට හැකි බව සොයා ගෙන ඇත. ඒ සඳහා මුඛ සෞඛ්‍යය පවත්වා ගැනීමට දත් මැදී ම අනිවාර්ය අංගයක් බව නොකිවමනා ය. ඒ අනුව දත් මැදී ම සහ ඇසෙහි පෙනීම අතර සම්බන්ධයක් ඇතිබවත් දත් නොමැදී ම හේතුවෙන් අක්ෂි ආබාධ හා පෙනීමේ දුර්වලතා ඇති වන බව නූතන විද්‍යාත්මක රාමුවක් තුළ පැහැදිලි කොට ඇත.

**නිගමනය**

මෙහි උපන්‍යාසය කොටගත් බුදුරජාණන් වහන්සේ දේශනා කළ දත් මැදී ම හෝ දැහැටි වැළඳීම ඇස් පෙනීමට හේතුවන බව වසර දෙදහස් හයසියයකට පෙර වූ දේශනාවකි. එය වත්මනෙහි නූතන විද්‍යාත්මක රාමුවක් තුළ තහවුරු කිරීම මඟින් පැහැදිලි වනුයේ බුද්ධ දේශනාවෙහි විසිඑක්වන ශතවර්ෂයේ වලංගුතාවයි.

**මුඛ්‍යපදඃ ඇස්පෙනීම, දත්මැදීම, දන්තකට්ඨ, දැහැටි වැළඳීම**

**ආශ්‍රිත ග්‍රන්ථ**

අලගියවන්න, පුලතිසි. *සංස්කෘත සිංහල ශබ්දකෝෂය.* (2007). කොළඹ 10ඃ සූර්ය ප්‍රකාශකයෝ.

*අංගුත්තර නිකාය 04.* (2006). නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. *පාලි සිංහල අකාරාදිය.* නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*විනයපිටක චුල්ලවග්ගපාළි.* (2006). නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

Anveli. dental. (2017). Eye problems Following a dental infection. https://anveli.dental/article/eye-dental-infections . Accessed 10.09.2024.

Bhikkhu Ariyesako. The Bhikkhus' Rules: *A Guide for Laypeople*. 1998. Australia.

Milani, Ramin Sharifi, Dominique Deville de Periere, Jean-Paul Micallef. Relationship Between Dental Occlusion and Visual Focusing. 2016. San Diego: University of California.

Motiwala (2023). The relationship between your eyes & teeth https://www.drmotiwala.com/the-relationship-between-your-eyes-teeth/, Accessed 10.09.2024.

Vadivel, Kumar, T. (2023). Can Gum Disease Make you lose your eyes. https://www.youtube.com/watch?v=m3vftkYsNjE Accessed 10.09.2024.